අරණායක ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින හා කළමනාකරණ වාර්තාව 2019 ජූනි 25 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් රු. 93,260 ක විදුලි භාණ්ඩ තොගය හා රු. 1,223,524 ක් වටිනා අනෙකුත් භාණ්ඩ තොගය ගිණුම්ගතකර නොතිබුණි. | සියළු තොග ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී විදුලි භාණ්ඩ තොගය සහ අනෙකුත් භාණ්ඩ තොගය ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුලත් රු. 296,435 ක් වටිනා පරිගණක, ලී බඩු හා අනෙකුත් භාණ්ඩ ගිණුම්ගතකර නොතිබුණි. | සියළු තොග ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී මෙය ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් විෂයයන් 07 ක ශේෂ හා උපයෝගී ලේඛන/වාර්තා අතර රු. 1,940,710 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයේ සිට පවතින රු. 180,534 ක වෙනස 2018 වර්ෂය අවසානයට රු.180,584 ක් වී ඇත.<br>රු. 330,619 අත්තිකාරම් ශේෂය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට ලිපි ලේඛණ සභාව සතුව නොමැති බැවින් නිරවුල් කළ නොහැකිව ඇත.<br>විවිධ තැන්පත් ශේෂයට ගෙවල් කුලී සහ සතිපොල ආරක්ෂිත තැන්පත් ඇතුලත් වී නොමැති නිසා වෙනසක් සිදුවී ඇත.<br>2014 වර්ෂයට පෙර සිට පවතින සේවක ඇප තැන්පත් ශේෂයේ වෙනස තව දුරටත් පරීක්ෂා කර සොයා බැලීමට කටයුතු කරමි . |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2001 වර්ෂයට පෙර සිට පවතින රු. 631,350 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළයුතුවේ. | මෙම ශේෂය පිළිබඳව තොරතුරු සොයා ගැනීමට අදාල ලිපි ලේඛණ සභාව සතුව නොමැති බැවින් එම ශේෂය නිරවුල් කළ නොහැක. |

(ඉ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 2 ඉක්ම වූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 433,973 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ටෙන්ඩර් තැන්පත් හා කර්මාන්ත සඳහා ලැබීම් වලින් රු.32,514 සහ මිශ්‍ර තැන්පත් වලින් රු. 5,672 ක් ආපසු ගෙවා ඇත. මාර්ගවල ඇති ගැටලුකාරී තත්වයන් නිසා ආපසු ගෙවිය නොහැකි මුදල් පවතී. ගිවිසුම් ඇප තැන්පත් මුදල් ආපසු ගෙවිය නොහැකි අතර ආපසු නොගෙවන අක් මුදල් ආදායමට ගැනීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම.
--------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කලමණාකරණ තීරණවලට අනුකූල නොවීම.
--------------------------------------------------------------------------------

| නීති,රීති,රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන හා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය | වර්ෂ 05 කට වරක් සිදු කල යුතු වරිපනම් බදු තක්සේරුව 2011 වර්ෂයෙන් පසු සිදුකර නොතිබුණි | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරුවක් සිදු කිරීමට අවශ්‍ය සියලු ලිපිලේඛණ තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇතත් මෙතෙක් ඉටුකර දී නොමැත. |

2 මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,202,140 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,764,751 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1. ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------------------------------------

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| වරිපනම් හා බදු | 2,567,000 | 2.814.733 | 2,769,007 | 108,779 | 2,517,000 | 2 ,657,613 | 2,547,042 | 250,616 |
| කුලී | 2,642,600 | 1 ,924,885 | 1 ,923,273 | 321,130 | 1,925.800 | 1,849,730 | 1,730,190 | 364,816 |
| බලපත්‍ර ගාස්තු | 360,100 | 367,352 | 367,353 | - | 355,500 | 455,935 | 455,936 | - |
| වෙනත් ආදායම් | 53,992,700 | 59,720,198 | 34,183,434 | 32,773,354 | 45,008,760 | 44,085,000 | 27,392,125 | 28,482,031 |

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 69,185 ක් වූ අතර වසර 01 සිට වසර 10 ක අතර කාලයක් තුල අය නොවී පවතින ශේෂය රු. 12,653 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් හා බදු 2011 තක්සේරුවට ඇතුලත් නොවූ රු.12,653 ක් කපා හැරීමට මහ සභාවට ඉදිරිපත් කර ඇත . 2018 දෙසැම්බර් 31 දිනට ඇති හිගයෙන් රු. 20,282 ක් 2019 වර්ෂයේදී අයකර ඇත . තවද ගැටලුකාරී ස්ථාන 5 න් අයවිය යුතු මුදල රු. 10,695 ක් අය කිරීමට හෝ නිදහස් කිරීමටත් ඉතිරි මුදල් 2019 වර්ෂයේදී අයකිරීමට කටයුතු කරමි . |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිප්පිටිය සති පොලේ 2002 හා 2004 වර්ෂ සඳහා රු. 55,672 ක කුලී අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගත නොහැකි තත්ත්වයක රු. 20,220 ක් පවතින අතර අනෙක් හිඟ මුදල සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් ඉක්ම වූ හිඟ ගෙවල් කුලී රු.247,058 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අරණායක විවිධ සේවා සමුපකාර සමිතියෙන් අයවිය යුතු රු. 4,558 සහ ඉතිරි රු.242,500 ක හිග ගෙවල් කුලිය සම්බන්ධයෙන් සභා තීරණය අනුව කටයුතු කරගෙන යමි. |

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 3,417,125 ක් හා මුද්දර ගාස්තු රු.15,910,526 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී උසාවි දඩ රු. 658,000 ක් හා මුද්දර ගාස්තුව රු.13,163,176 ක් අයකර ගෙන ඇත. රු. 542,925 ලේඛණයෙන් ඉවත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කාර්ය සාධනය
------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ

(අ) ක්‍රියාකාරී සැලැස්ම
-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම අනුව කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය සඳහා ඉඩමක් මිලදී ගැනීමට, වරිපනම් බදු ප්‍රදේශ පුළුල් කිරීමට සහ අක්කර බදු සැලැස්මක් සකස් කිරීමට සැලසුම්කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉටු කිරීමට අපේක්ෂිත අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | (1) වරිපනම් බල ප්‍රදේශ පුළුල් කිරීම, අක්කර බදු සැලැස්මක් සකස් කිරීම ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි .<br>(11)කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා අයත් දෙබත්ගම වත්ත නැමැති ඉඩමෙන් අක්කර 05 ක මැනුම් අවසන් කර පාරිසරික නිර්දේශය ලබා දී ඇත . |
| (ii) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට සැලසුම් කර තිබුණද එය සිදු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා කිහිපයක් ඉදිරි කාලයේදී පනවා ගැනීමට කටයුතු කරමි. ඝන අපද්‍රව්‍ය පිළිබඳ අතුරු ව්‍යවස්ථා බලාත්මක කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කසල බැහැර කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් කසල කළමනාකරණ වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාව විසින් ගැසට් කර ඇති අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරමි.<br>මෙම සභාවට කසළ බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් සොයා ගැනීම අසීරු |

කාර්යයක් වී ඇත . එම නිසා පර්චස් 50 ක පමණ භූමියක් විශාල මුදලක් ගෙවා බදු පදනම මත ලබාගෙන එම ස්ථානයට කසළ බැහැර කිරීම සිදු කරනු ලැබේ.

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොමැති බැවින් ඉඩ පහසුකම් නොමැති නාගරික ජනතාවට එම සේවාව ලබා ගැනීමට නොහැකිවී තිබුණි. | ජනතාවට පහසුකම් සැලසීම සඳහා ක්‍රමවේදයක් සකස්කර ගත යුතුවේ. | ප්‍රාදේශීය සභාව සතුව ගලි බැහැර කිරීම සඳහා සුදුසු ඉඩමක් නොමැත . සුදුසු ස්ථාන ඇති අයට පමණක් ගලි සේවය ලබාදේ. ඉදිරියේදී ගලි බැහැර සඳහා සුදුසු ඉඩමක් ලැබුණු පසු ඉල්ලුම්කරුවන් සියලු දෙනාටම සේවාව ලබාදීමට කටයුතු කරමි . |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට තනතුරු වර්ග 11 ක සේවක පුරප්පාඩු 13 ක් හා එක් තනතුරක සේවක අතිරික්ත 2 ක් විය. | පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්තය විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට සභාවට බලය ලබා දී නොමැති පුස්තකාලයාධිපති , පෙරපාසල් ගුරු , සෞඛ්‍ය පරිපාලක , ඖෂධ සංයෝජක සහ ආදාහනාගාර ක්‍රියාකරු තනතුරු සඳහා මාසිකව සහ ත්‍රෛමාසිකව පළාත් පාලන කොමසාරිස් තුමා හා ප්‍රධාන ලේකම්තුමා වෙත දැනුම් දී ඇත. අනෙකුත් පුරප්පාඩු සහ අතිරික්තතා සම්පූර්ණ වී ඇත . |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සුසාන භූමි ලේඛනය අනුව සුසාන භූමි 38 ක් පවතින අතර සභාව සතු සුසාන භූමි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර දේපල ආරක්ෂාකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකර පවරාගැනීම් සිදුකල යුතුවේ. | සභාව සතු සුසාන භූමි පිළිබදව සමීක්ෂණයක් සිදුකර අදාල මිනුම් හා පවරා ගැනීම් සිදුකර දේපල ආරක්ෂා කර ගැනීමට මහ සභාව දැනුවත් කර ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි . |

3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් පාලන අමාත්‍යාංශයට හා සබරගමුව පළාත් සභාවට අයත් රු.33,556,588 ක් වටිනා වාහන 08 ක් හා ට්‍රේලර් 04 ක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන පවරා ගැනීමේ ආකෘති පත්‍ර සකස් කර ඇත . එම අයදුම්පත් අත්සන් කර අදාල ආයතන වෙත හැකි ඉක්මණින් ඉදිරිපත් කර පවරා ගැනීමට කටයුතු කරමි. |

3.3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 ජනවාරි 18 දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබූ රු. 784,300 ක් වූ බේල් යන්ත්‍රය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ. | පොලිතින් කුට්ටි කිරීමේ බේල් යන්ත්‍රය යොදා කටයුතු කිරීමට මේ දක්වාම සිදු කිරීමට අවශ්‍යතාවයක් නොවුණි. |
| (ආ) දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින, රු. 5,055,698 ක් වටිනා වාහන හා යන්ත්‍ර 06 ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

3.4 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු. 40,000 ක් වටිනා බහුකාර්ය ජංගම කුටිය හා රු.3,000 ක් වටිනා භාණ්ඩ අයිතම 3 ක ඌනතාවයට වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බහුකාර්ය ජංගම කුටිය සඳහා වගකිව යුතු නිලධාරී විසින් ජංගම කුටියක් සකස් කරදීමට කටයුතු කරන අතර රු.3,000 ක් වටිනා භාණ්ඩ අයිතම තුන සඳහා මුදල් අයකිරීමට කටයුතු කරමි . |

4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය
--------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණය මගින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයයන් 28 ක රු.1,627,120 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් හා වැය විෂයයන් 11 ක රු.1,015,000 ප්‍රතිපාදන වලින් සියයට 80 ත් සියයට 99 ත් අතර ප්‍රමාණයක එකතුව රු. 2,547,658 උපයෝජනය කර නොතිබුණි. | තාත්වික අයවැය ලේඛන පිළියෙල කල යුතුවේ. | දෛනික වැටුප් , විදේශ ගමන් වියදම්, නීතිඥ ගාස්තු,විගණන ගාස්තු, පුහුණු වැඩ සටහන්, පළාත් පාලන සතිය, සුභ සාධන ගෙවීම් ,දුම්රිය බලපත්‍ර ගාස්තු, නඩු ගාස්තු, නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු, අර්ථ සාධක ගෙවීම්, කාණු අලුත්වැඩියා වැනි වියදම් සිදුවී නොමැත. |

4.2 විගණන හා කළමණාකරන කමිටු
----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා පළමු රැස්වීම 2019 මාර්තු 12 දින පවත්වා ඇති අතර අනෙකුත් රැස්වීම් 2019 ජූනි 11 සැප්තැම්බර් 19 දෙසැම්බර් 05 දින පැවැත්වීමට යෝජනා කර ඇත. |